ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව.
இலங்கை மதுவரித் திணைக்களம்.
EXCISE DEPARTMENT OF SRI LANKA.
මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය.
ஊடகப் பேச்சாளர் அலுவலகம்.
Office of the Media Spokesman.

තැ.පෙ. අංකය / த.பெ.இல. / P.O.Box No } 1417
දුරකථන අංකය / தொலைபேசி எண் / Tele. No } 1913
ෆැක්ස් / பெக்ஸ் / Fax } 011 20 966 79
ඊ-මේල් / மின்னஞ்சல் / E-Mail } oicoptroom@excise.gov.lk

අංක 353, කෝට්ටේ පාර, රාජගිරිය. இல.353,கோட்டை வீதி,இராஜகிரிய. No 353, Kotte Road, Rajagiriya.

මගේ අංකය / எனது இல / My No. } ED/01/OPS ROOM/13
ඔබේ අංකය / உமது இல / Your No. }
දිනය / திகதி / Date } 2022. 03. 08

**සුරාබදු මාධ්‍ය නිවේදනය.**

## මාර්තු 22 දිනයෙන් පසු මත්පැන් සැපයුම නවතින බවට පළවන සාවද්‍ය ප්‍රවෘත්තිය පිළිබඳවයි.

01. ඉන්ධන හිඟය හා විදුලිය කප්පාදුව හේතුවෙන් එතනෝල් නිෂ්පාදනයට බාධා පැමිණීම නිසා ප්‍රමාණවත් පරිදි එතනෝල් නොලැබීමෙන් 2022 මාර්තු මස 22 වන දින සිට මත්පැන් නිෂ්පාදනය නතර කරන බවට සමාජ මාධ්‍යයන්හි පළවන වාර්තා සහ ඒවා පදනම් කරගනිමින් ජනමාධ්‍යයන්හි පළවන ප්‍රවෘත්ති සාවද්‍ය බවට සුරාබදු දෙපාර්තමේන්තුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. අරක්කු ඇතුළු දේශීය මත්පැන් නිපදවන සුරාබදු බලපත්‍ර ලත් මත්පැන් නිෂ්පාදනාගාර 23ක් දිවයින තුල ක්‍රියාත්මක වන අතර, ඒවාට අවශ්‍ය එතනෝල් ඇතුළු අමුද්‍රව්‍ය දේශීය වෙළෙඳපොළ තුළින් ලබා ගැනීමේ හැකියාව මේ දක්වා පවතින බවද මෙයින් අවධාරණය කරනු ලැබේ.

03. මෙම සාවද්‍ය වාර්තා හා ප්‍රවෘත්ති හේතු කොට ගෙන නීති විරෝධී ලෙස මත්පැන් රැස්කිරීමටත්, මත්පැන් නිෂ්පාදනාගාරකරුවන් අතර සදාචාර සම්පන්න නොවන අලෙවිකරණ උපාය මාර්ගයන් අනුගමනය කිරීමටත් අවකාශ ලැබෙන හෙයින් එම වාර්තා හා ප්‍රවෘත්ති නිවැරදි කිරීමට ක්‍රියා කරනු ඇතැයි උදක්ම බලාපොරොත්තු වනු ලැබේ.

කපිල කුමාරසිංහ
සුරාබදු කොමසාරිස් (නීති ක්‍රියාත්මක කිරීම)
මාධ්‍ය ප්‍රකාශක / ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව.